ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන

අවසාන පරීක්ෂණය – 2006/2007 පළමුවන අධ්‍යයන වාරය

අධ්‍යාපන පදනම – **ESP 1202**

කාලය – පැය තුනයි.

---

දිනය : 2007.03.18 වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලටත් 11 වන කොටසේ ප්‍රශ්නවලින් තුනකටත් පිළිතුරු සපයන්න.

## I වන කොටස

1. රටක සමාජ පන්තිවල පවතින වෙනස්කම් අවම කිරීම සඳහා සැලසුම් කර ක්‍රියාත්මක කළ හැකි අධ්‍යාපනික ප්‍රතිපත්තියක් යෝජනා කරන්න.

2. තම දරුවන් සමාජානුයෝගී කිරීම සඳහා දෙමාපියන් භාවිත කරන ක්‍රම ශිල්ප දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

3. 'යාවජීව අධ්‍යාපනය හා ඉගෙනුම් සමාජයක් අතර සමීප සම්බන්ධතාවක් ඇත.' – ඔබේ අදහස් දක්වන්න.

4. මහත්මා ගාන්ධිගේ 'නායිතාලිම් (Nai Thalim) අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන මූලධර්ම තුනක් දක්වන්න.

5. 'සංවර්ධනය යන සංකල්පයේ නිර්වචනය වර්තමානයේ දී වෙනස් වී ඇත.' – ඔබ මෙම අදහසට එකඟ වන්නේ ද?

   ඔබේ අදහස සනාථ කිරීමට හේතු දෙකක් දක්වන්න.

6. (අ) 'අකල්ප හා අගයන්' (ආ) 'අගයන් හා සදාචාර විනිශ්චයන්' අතර සම්බන්ධතාව සුදුසු නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

7. 'විවෘත අධ්‍යාපනය යනු බිත්ති වලින් තොර අධ්‍යාපනයයි' – ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙම වගන්තිය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

8. පහත දැක්වෙන සමවිය ඉගෙනුම් ක්‍රම තුන පැහැදිලි කරන්න.

   (i) සහයෝගික ඉගෙනුම

   (ii) සමවයස්ථකයින් විසින් උපකාරක ඉගෙනුම

   (iii)සමවයස්ථකයින්ගේ සහයෝගිතා – ඉගැන්වීම

## II වන කොටස

9. (i) විධිමත්, නොවිධිමත් හා අවිධිමත් අධ්‍යාපන ක්‍රම වල වෙනස පෙන්වා දෙන්න.

(ii) 'විධිමත් අධ්‍යාපන ක්‍රමයේ වාසි මෙන්ම අවාසි ද ඇත.' – ඔබේ අදහස් දක්වන්න.

(iii) ශ්‍රී ලංකාවේ නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් විධිමත් අධ්‍යාපනයට පරිපූරකයක් වන ආකාරය හා විධිමත් අධ්‍යාපනයෙන් ලැබූ ඉගෙනුම පෝෂණය කරන ආකාරයත් සාකච්ඡා කරන්න.

10. (i) 'සමාජ සචලතාව' යන්න නිර්වචනය කරන්න. පරම්පරා අතර සචලතාව හා පරම්පරා ඇතුළත සචලතාවයේ වෙනස දක්වන්න.

(ii) පුද්ගලයින්ගේ සමාජ සචලතාව නැංවීමේ දී අධ්‍යාපනයේ භූමිකාව සාකච්ඡා කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ පුද්ගලයින්ගේ සමාජ සචලතාවයට බාධා පමුණුවන සාධක විශ්ලේෂණය කරන්න.

11. (i) ප්‍රාථමික සමාජානුයෝගය හා ද්විතියික සමාජානුයෝගය නිර්වචනය කරන්න.

(ii) සමාජානුයෝගී කාරකයක් ලෙස පවුලේ භූමිකාව සාකච්ඡා කරන්න.

(iii) පාසල තුල දී හා ඉන් පිටත දී සිදුවන සමාජානුයෝගී ක්‍රියාවලියේ දී සම වයස්කයින් වැදගත් වන අකාරය විශ්ලේෂණය කරන්න.

12. (i) දර්ශනයේ ස්වභාවය කුමක් ද?

(ii) අධ්‍යාපනය හා දර්ශනය අතර ඇති සම්බන්ධය කුමක් ද?

(iii) ඕනෑම අධ්‍යාපන දර්ශනිකයින් දෙදෙනෙක් තෝරා ගෙන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ දායකත්වයන් වෙන් වෙන්ව විස්තර කරන්න.

13. (i) වර්තමාන පාසල් සමාජයේ සාරධර්ම පිරිහීම උග්‍රවීමට බලපාන සාධක සාකච්ඡා කරන්න.

(ii) සිසුන් තුළ සාරධර්ම ප්‍රගුණ කිරීමට ගුරුවරුන්ට සහාය විය හැකි ආකාරය පැහැදිලි කරන්න.

(iii) සාරධර්ම අධ්‍යාපනයේ දී ආගමික සංවිධාන හා බහු මාධ්‍යයන්ගේ භූමිකාව ඇගයීමට ලක් කරන්න.

14. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් (02) පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(i) 'ගුණාත්මක අධ්‍යාපනයක් උදෙසා සැපයිය යුතු අත්‍යවශ්‍ය දෙයකි, ගුරුවරුන්ගේ අධ්‍යයන හා වෘත්තීය තත්ත්වයන් යාවත්කාලීන කිරීම.

(ii) 'අධ්‍යාපනය වර්තමානයට මෙන්ම අනාගතයට ද අද්විතීය අයෝජනයක් වේ.'

මෙම ප්‍රධාන මූලධර්මය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ මූලික අංගයක් වේ.

(iii) 'ශ්‍රී ලංකාවේ උගතුන් අතර ඇති ඉහළ විරැකියා මට්ටම, අධ්‍යාපනය ශ්‍රම වෙළඳ පොලේ අවශ්‍යතා වලට ඇති අඩු අදාළත්වයේ සාක්ෂාත්කරණයයි.'

- හිමිකම් ඇව්රිණි -